# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,286 - 2022 ජුනි මස 24 වැනි සිකුරාදා - 2022.06.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1082 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1083 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1087 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1088 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1090 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 ජූලි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූලි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය

ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම්පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ හා 2020 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් වෙන්දේසියට නිර්දේශ කරන ලද භාණ්ඩ **2022.07.10 වැනි ඉරිදා දින පෙ. ව. 09.30ට** අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට විනාඩි 30කට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේදී මිළදී ගනු ලබන භාණ්ඩයන් සඳහා එවෙලේම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැනුම්කරුවන් භාණ්ඩ මිලදී ගැනීමේදී ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

07. වෙන්දේසියට පැමිණෙන ගැනුම්කරුවන් රජය විසින් පනවන ලද සෞඛ්‍ය නිර්දේශයන්ට යටත්ව වෙන්දේසි භූමියට පැමිණිය යුතුය.

පවිත්‍රා සංජීවනී පතිරණ,
මහේස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු.

2022 ජුනි මස 08 වැනි දින,
ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ දී ය.

වෙන්දේසි නඩු භාණ්ඩ ලැයිස්තුව

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | AR 538/22 | අංක VP - 9854 යතුරු පැදි (අමතර කොටස් සඳහා) | 01 |
| 02 | AR 503/22 | අංක GD - 0603 යතුරු පැදි (ලියාපදිංචි කළ හැක) | 01 |
| 03 | AR 4647/20 | අංක 146 - 5265 යතුරු පැදි (අමතර කොටස් සඳහා) | 01 |
| 04 | AR 540/20 | MQ - 7478 යතුරු පැදි (අමතර කොටස් සඳහා) | 01 |
| 05 | AR 4517/20 | අංක JK - 7417 යතුරු පැදි (අමතර කොටස් සඳහා) | 01 |
| 06 | 15347 (B.39552) | අංක SP HK - 8734 යතුරු පැදි (ලියාපදිංචි කළ හැක) | 01 |
| 07 | AR 288/21 | අංක BET - 2113 යතුරු පැදි (අමතර කොටස් සඳහා) | 01 |
| 08 | AR 289/21 | අංක GB - 8000 යතුරු පැදි (අමතර කොටස් සඳහා) | 01 |
| 09 | 62386 | අංක PY - 1190 ලොරි රථ (ලියාපදිංචි කළ හැක) | 01 |
| 10 | 80127 | අංක LB - 6183 ලොරි රථ (අමතර කොටස් සඳහා) | 01 |
| 11 | 14029/8481 | අංක LE - 6299 ලොරි රථ (අමතර කොටස් සඳහා) | 01 |
| 12 | AR 3426/20 | පා පැදි | 01 |
| 13 | AR 4044/20 | පා පැදි | 01 |
| 14 | AR 256/20 | පා පැදි | 01 |
| 15 | 23249 | කපන ලද ප්ලාස්ටික් බැරල් | 06 |
| | | වතුර මෝටර් | 01 |
| | | Micro Electric Rope Hoist | 01 |
| 16 | නඩු අංක රහිත | ප්ලාස්ටික් තාච්චි | 04 |
| | | යකඩ තාච්චි | 04 |
| 17 | 12047 | කහ පාට ගෑස් සිලින්ඩර් | 01 |
| 18 | 10417 | කහ පාට ගෑස් සිලින්ඩර් | 01 |
| 19 | 10391 | කහ පාට ගෑස් සිලින්ඩර් | 01 |
| | | කුඩා ගෑස් ලිප | 01 |
| 20 | 18483 | නිල් පාට කුඩා ගෑස් සිලින්ඩර් | 01 |
| | | ලිප් 03 සහිත ගෑස් ලිප් 01 | 01 |
| 21 | 14785 | සවල් | 01 |
| | | යකඩ කපන කියත් | 01 |
| 22 | 22187 | සවල් | 01 |
| 23 | 8004 | සවල් | 01 |
| 24 | 17136 | Electronic තරාදි (ගෘහස්ථ ප්‍රයෝජනය සඳහා) | 01 |
| 25 | 11522 | Electronic තරාදි (ගෘහස්ථ ප්‍රයෝජනය සඳහා) | 01 |
| 26 | 11520 | Electronic තරාදි (ගෘහස්ථ ප්‍රයෝජනය සඳහා) | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 27 | 11524 | රවුම් දුනු තරාදි | ගෘහස්ථ ප්‍රයෝජනය සඳහා | 01 |
| 28 | 11525 | Electronic තරාදි | | 01 |
| 29 | 2059/13 | Electronic තරාදි | | 01 |
| 30 | 14785 | ග්‍රයින්ඩර් | | 01 |
| | | මිටි | | 03 |
| | | උල් කටු | | 03 |
| | | ඩ්‍රිල් | | 01 |
| 31 | 14786 | මේසන් හැඳි | | 02 |
| | | ප්ලාස්ටික් තාච්චි | | 01 |
| 32 | 10461 | ප්‍රෙෂර් කුකර් | | 01 |
| | | ගෑස් ලිප් | | 01 |
| 33 | 19922 | ගෑස් ලිප් | | 01 |
| 34 | 20369 | වතුර යට ගෙන යන ටෝච් | | 02 |
| 35 | නඩු අංක රහිත | යකඩ බාල්දි | | 05 |
| 36 | 05246 | දුනු තරාදි (ගෘහස්ථ ප්‍රයෝජනය සඳහා පමණි) | | 01 |
| 37 | 10864 | කුඩ | | 02 |
| 38 | 25140 | උදලු | | 01 |
| 39 | නඩු අංක රහිත | තැටි තරාදි (ගෘහස්ථ ප්‍රයෝජනය සඳහා පමණි) | | 01 |
| 40 | 17716 | ගෑස් ලිප් | | 01 |
| 41 | නඩු අංක රහිත | කුඩා ගෑස් ලිප් | | 06 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 42 | 15427 | කුඩා ගෑස් ලිප් | 03 |
| | | ගෑස් සිලින්ඩර් | 01 |
| 43 | 31832 | රෙදි සෝදන යන්ත්‍ර | 01 |
| | | විදුලි ස්ත්‍රික්ක | 01 |
| | | උණු වතුර බෝතල් | 01 |
| | | ටෝස්ටරය | 01 |
| 44 | AR 512/22 | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 45 | 62685 | ජංගම දුරකථන | 01 |
| 46 | 12358 | ජංගම දුරකථන | 01 |
| 47 | 37213 | ජංගම දුරකථන | 01 |
| 48 | AR 3135/19 | බැටරි | 01 |
| 49 | නඩු අංක රහිත | හිස් කෑන් හා බුලි තොගයක් | |
| 50 | නඩු අංක රහිත | වීදුරු බෝතල් තොගයක් | |

භාණ්ඩ සමීක්ෂණය මගින් වෙන්දේසියට නිර්දේශ කරන ලද භාණ්ඩ

| අනු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | විත්ති කුඩු | 01 |
| 02 | කැරකෙන පුටු | 06 |
| 03 | වානේ අල්මාරි | 04 |
| 04 | බිත්ති ස්පීකර් | 06 |
| 05 | ප්‍රින්ටර්ස් | 01 |

06-339

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2023 වර්ෂය

2023 ජනවාරි මස 01 වැනි දින සිට 2023 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයන්හි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට්* පත්‍රයේ සුරාබදු කොමසාරිස්වරයා විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට යටත්ව **2022 සැප්තැම්බර් මස 07** වැනි දින **පෙ.ව. 10.30** දක්වා නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිලදී ගැනීම සඳහා ඉදිරිපත් වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල මෙම කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සි ද, ඉහත දක්වා ඇති *ගැසට්* නිවේදනයේ වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව කවරයක බහා එයට මුද්‍රා තබා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන දිනට හා වේලාවට

පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් නාරම්මල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් සඳහා ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන **2022 සැප්තැම්බර් මස 07 වැනි දින පෙ. ව. 10.30** ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසිම කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය නාරම්මල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාදය මිලදීගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කළ දින ප.ව. 3.00 ට පෙර නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. 2022 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2023 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව, ටෙන්ඩරය ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා නාරම්මල ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ද ලබාගත යුතු ය.

08. **2022 සැප්තැම්බර් මස 07** වැනි දින රේන්දය විකිණීමෙහිලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් **2022 ඔක්තෝබර් මස 07 වැනි දින පෙ. ව. 10.30** ට නැවත රේන්ද විකිණීම මෙම ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍යනම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඩබ්. පී. සී. එන්. පතිරණ,
ප්‍රාදේශීය ලේකම්.

2022 ජුනි මස 08 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *රා තැබෑරුම විවෘත කර තබන වේලාවන්* |
|---|---|---|---|---|
| 01 | නාරම්මල | 2022.09.07 දින පෙ. ව. 10.30 ට පෙර | 1,000 | පෙ.ව. 11.00 - ප.ව. 2.00 දක්වා<br>පෙ.ව. 5.00 - රාත්‍රී 8.00 දක්වා |

06-314

---

**හම්බන්තොට ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය**

2023 වර්ෂයට හම්බන්තොට කොට්ඨාසයේ රා රේන්ද විකිණීම

2023 ජනවාරි 01 වැනි දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පහත උපලේඛනයේ විස්තර සඳහන් රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා පොදුවේ සෑම සුරාබදු බලපත්‍රයක්ම වෙනුවෙන් දැනට බලපවත්නා හා ඉදිරියට බලපැවැත්විය හැකි කොන්දේසිවලට යටත්ව හම්බන්තොට කොට්ඨාසයේ පිහිටි අංක 01 දරන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

02. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 5,000/- ක් හම්බන්තොට ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් නියමිත පෝරමය ඉදිරිපත් කළ යුතු ය. තව ද, ටෙන්ඩර්කරු විසින් පහත සඳහන් ගැසට් නිවේදනයේ පරිදි වත්කම් සහිත සහතික ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිහිටි ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගෙන ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතු ය.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතු ය. නියෝජිතයෙකු විසින් හෝ ලාංකික නොවූ හා 1982.08.20 වැනි දින අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද 1982 වර්ෂයේ රා රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු වන්නන්ගෙන් ටෙන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ.

04. මෙම තැබෑරුම වෙනුවෙන් එක් අයෙකු විසින් එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පස් දෙනෙකුට වඩා හවුල් වන ටෙන්ඩර් පත්‍ර ද ඉදිරිපත් කළ නොහැක.

05. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයක බහා සීල් තබා කවරයේ වම්පස මුදුනේ "හම්බන්තොට කොට්ඨාසයේ අංක 01 දරන රා තැබෑරුම් රේන්ද සඳහා ටෙන්ඩර් - 2023" යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කළ යුතු ය. ටෙන්ඩර් සහිත කවරය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් **2022.08.12 වැනි දින පෙ. ව. 10.30** ඉකුත් වීමට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් වසන වේලාවේදී සියලුම ටෙන්ඩර්කරුවන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතු ය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්දය විකිණීමේ කොන්දේසි වලට අත්සන් කර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතු ය.

07. ටෙන්ඩර් පත්‍රයේ හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ නියමිත හේතූන් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. කිසියම් හේතුවක් නිසා ටෙන්ඩර් භාර ගැනීමට නියමිත **2022.08.12** වැනි දිනට අවලංගු කිරීමට සිදුවුවහොත් නැවත ටෙන්ඩර් භාර ගන්නා දිනය **2022.09.12** වැනි දින වේ.

09. වැඩි විස්තර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැන ගත හැකිය.

කෞශල්‍යා ගලප්පත්ති,
ප්‍රාදේශීය ලේකම්.

2022ක් වූ ජුනි මස 16 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර්පත් භාර ගැනීම* | *තැබෑරුම විවෘතව තැබිය යුතු වේලාවන්* |
|---|---|---|---|---|
| 01. | හම්බන්තොට | හම්බන්තොට | 2022.08.12<br>පෙ. ව. 10.30 | පෙ. ව. 10.00 සිට<br>ප. ව. 2.00 දක්වා සහ<br>ප. ව. 5.00 සිට<br>ප. ව. 9.00 දක්වා |

06 - 350

---

**2022.05.27 දින පළ වූ 05-150 නිවේදනය නැවත පළ කිරීමයි**

**මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි පත්තු, ආරයම්පති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2022 ජූලි 01 දින සිට 2023 ජුනි 30 දක්වා වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

අංක 207 දරන 1982.08.20 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයට අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි පත්තු, ආරයම්පති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා

තැබෑරුම් සඳහා **2022 ජූලි** මස **01** වැනි දින සිට **2023 ජූනි** මස **30** දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා පැමිණ සිටිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සිය (රු. 1500/-) මුදලක් මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් නමින් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත ලබා ගත හැකිය. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතුයි. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ **2022.06.24** දින සිට **2022.07.08** වැනි දින පස්වරු 3.00 දක්වා වේ.

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට අඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් පත්‍රයේ මුල්පිටපතක් ටෙන්ඩර් පත් සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම්, ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් දින සිට සති දෙකක් තුළ ඔබ ලබා ගත් ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. තැබෑරුම දැනට පවත්වන ස්ථානයේ ඉදිරි කාලයේත් අඛණ්ඩව තිබේද යයි සහතික කිරීමට නොහැක.

06. ලියාපදිංචි කළ පොල් හා තල් සමුපකාර සමිති මෙම රේන්ද විකිණීමේදී සහභාගීවන්නේ නම් සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර දැනට සමිතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳව ද හා රා තැබෑරුම බදු ගෙන පවත්වා ගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතු ය.)

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

න. සද්‍යානන්ති,
ප්‍රාදේශීය ලේකම්,

2022ක් වූ ජුනි මස 20 වැනි දින,
මඩකලපුව මහලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | |
|---|---|---|---|
| | | *දිනය* | *වේලාව* |
| මණ්මුනයි පත්තු | ආරයම්පති - දකුණ ග්‍රාම නිලධාරි වසම | 2022.07.11 | පෙරවරු 9.30 |

*සටහන :*

1. ටෙන්ඩර් මණ්ඩලය 2022.07.11 දින පෙරවරු 10.30ට රැස්වේ.
2. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම **2022.07.14 දින පෙරවරු 10.30** ට පැවැත්වේ.

06 - 372

# රජයේ නොවන දැන්වීම්

### ඇටර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 07, රොස්මිඩ් ඇවනියු, අංක 07 දරන ස්ථානයෙහි පදිංචි සී. පී. ස්වර්ණකාන්තන් හෙවත් සොර්ණකාන්තන් (කැනේඩියානු ගුවන් ගමන්බලපත්‍ර අංක GF GF488764) වන මා විසින් 2015.09.16 වැනි දින ලියා සහතික කරන ලද දින දිනපොත් අංක 2912 හා ෆෝලියෝ 32 හා වොලියුම් 08 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය කොළඹ 06, මුවර් පාර, කුවුන්කෝට් අපාර්ට්මන්ට් අංක 52-5/1 හි පදිංචි ජයකුමාර් තංගවේලු (ජා. හැ. අ. 473482797V) වෙත ප්‍රදානය කරන ලද ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, එකී ජයකුමාර් තංගවේලු විසින් මා සඳහා සහ මා වෙනුවෙන් සිදුකරන ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වගකීම භාර ගැනීමක් සිදුනොකරන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. පී. ස්වර්ණකාන්තන් හෙවත් සොර්ණකාන්තන්

2022 ජුනි මස 16 වැනි දින.

06 - 301

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 242(3) වැනි වගන්තිය ප්‍රකාරව දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති අංක 242(3) ප්‍රකාරව අනන්තය වාද්දුව (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 2045) ලාෆ්ස් ලෙෂර් ලිමිටඩ් (PB 1192) සමඟ 2021.02.22 දින සිට ඒකාබද්ධ වූ බව දන්වා සිටිමු.

ඒකාබද්ධ වූ සමාගම ලාෆ්ස් ලෙෂර් ලිමිටඩ් වේ.

සමාගම් ලේකම්,
අනන්තය වාද්දුව (ප්‍රයිවට්) ලිමිටඩ්,
එච්. ආර්. එස්. එස්. හද්දෙගොඩ.

06 - 312

---

### ඇටර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ, වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල, නිකදළුපොත, ගනේවත්ත, පන්නව, අංක 68/2 හි පදිංචි කංකානමලාගේ ඉන්ද්‍රානි ජයසිංහ මැණිකේ ජා. හැ. අ. 197161003242 වන මා විසින්, මා වෙනුවෙන් ක්‍රියා කිරීමට පොලොන්නරුව තැපැල්, දිඹුලාගල, නව මිල්ලාන, අංක 24 හි පදිංචි කංකානමලාගේ මල්ලිකා ජයසිංහ මැණිකේ ජා. හැ. අ. 735132431V වෙත ප්‍රදානය කරන ලද කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් සරෝජනී තෙන්නකෝන් විසින් සහතික කරන ලද 2021 ක් වූ ජූලි මස 16 වැනි දින හා අංක 157 දරන ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිශ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බවත් එකී කංකානමලාගේ ඉන්ද්‍රානි ජයසිංහ මැණිකේ විසින් මා වෙනුවෙන් කටයුතු කිරීම නවතනු ලබන බවත් මෙදින සිට කරනු ලබන කවර හෝ ක්‍රියාවකට මා වගකීම් නොදරන බවත් ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුවටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

කේ. අයි. ජේ. මැණිකේ

2022 මැයි 09 වැනි දින.

06 - 317

---

### ඇටර්නි බලය අවලංගු කිරීම

මහනුවර, අම්පිටිය පාර, අංක 83 යන ලිපිනයේ පදිංචි ගාල්ලගේ දොන් ගාමිණී අල්විස් (විදේශ ගමන් බලපත්‍ර අංක - AK 1149778) වන මම, මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. ජිෆ්රි මහතා විසින් වර්ෂ 2013.04.22 වන දින ලියා සහතික කළ ඇටර්නි බලපත්‍රය මගින් මහනුවර, මුල්ගම්පොල විහාර මාවත, අංක 162/10 යන ලිපිනයේ පදිංචි ගාල්ලගේ දොන් පියතිස්ස අල්විස් (ජා. හැ. අංක. 502110489V) යන අය වෙත පවරන ලද එකී ඇටර්නි බලය මෙතැන් පටන් මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

ගාල්ලගේ දොන් ගාමිණී අල්විස්.

06 - 341

---

### ඇටර්නි බලය අවලංගු කිරීම

මිනුවන්ගොඩ, කුරුණෑගල පාර, මනමිණ දර්ශන මාවත, අංක 100/18 හි පදිංචි දළුගම ආචාරිගේ ඩයනස් (ජා. හැ. අ. 194409903303) වන මම, එකී ලිපිනයෙහි ම පදිංචි සමයමන්ත්‍රී රංජනී (ජා. හැ. අ. 535340790V) යන අය වෙත යූ. බී. ප්‍රේමතිලක ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2013.04.30 වැනි දින සහතික කළ අංක 24032 දරන ඇටර්නි බලපත්‍රය මගින් මා නමින් පෙනී සිට මා වෙනුවෙන් ක්‍රියා කිරීමට එකී ඇටර්නි බලපත්‍රය යටතේ දෙන ලද බලය අද පටන් අවලංගු කරන බවත් එකී සමයමන්ත්‍රී රංජනී යන අය අද පටන් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකාරිය නොවන බවත්, ඒ අනුව එකී අංක 24032 දරන ඇටර්නි බලපත්‍රය මින් ඉදිරියට නීතිය ඉදිරියේ කිසිදු බලාත්මකභාවයක් නොමැති බවත්, මෙයින් සමස්ත ශ්‍රී ලංකාවාසීන්ට දන්වා සිටිමි.

දළුගම ආචාරිගේ ඩයනස්.

06 - 345

---

### ඩී එෆ් ඇසොසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් ලියාපදිංචි අංකය PV 15328

2007 අංක 07 දරන සමාගම් පනතේ 324(3) සහ 334(2) වගන්තිය යටතේ ණයහිමියන්ගේ රැස්වීම පිළිබඳ කරනු ලබන නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 324(3) සහ 334(2) යන වගන්ති වලට අනුකූලව වර්ෂ 2022 ක්වූ ජූලි මස 15 වැනි දින ප.ව. 3.00 ට කොළඹ 03, ඇල්ෆඩ් පෙදෙස අංක 27, ජනතා කෝට්, අංක 5/4 දරන ස්ථානයේදී ඉහත සමාගමෙහි ණයහිමියන්ගේ රැස්වීමක් පවත්වන ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

(තවද එදින රැස්වීමට සහභාගී නොවන ණයහිමියන් වෙතොත් ණයහිමියන්ගේ රැස්වීමට පෙර දින පස්වරු 3.00 කොළඹ 03, ඇල්ෆ්‍රඩ් පෙදෙස අංක 27, ජනතා කෝට්, අංක 5/4 දරන ස්ථානයේ සමාගම් කාර්යාලයෙහි අදාළ පෙරකලාසි ගොනු කරන ලෙසද දැනුම් දෙනු ලැබේ.)

තවද, ණයහිමියන්ගේ රැස්වීමට පෙර සියලු ණයහිමියන්ගේ හිමිකම්, සුරක්ෂිත ණය හිමියන්ගේ සුරක්ෂණ ප්‍රකාශ, ඒවා ලබා දුන් දිනයන්, සහ තක්සේරු කරනු ලබූ වටිනාකම් සහිත ඡන්දය ප්‍රකාශ කිරීමේ අරමුණු ඉහත සඳහන් ලිපිනය දරන සමාගම් කාර්යාලය වෙත භාර දෙන ලෙස නිවේදනය කරනු ලැබේ.

වර්ෂ 2022ක් වූ ජූනි මස 16 වැනි දින දී ය.

ඩී එෆ් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අධ්‍යක්ෂ මණ්ඩලය

**සටහන** :- සමාගමේ ගණන් බේරා වසා දැමීමේ කටයුතු සම්බන්ධයෙන් ඇවරකරුවකු නම්කිරීම සහ ගණන්බේරා වසා දැමීමේ කටයුතු සඳහා පරීක්ෂණ කමිටුවක්, අවශ්‍යතාවය මත මෙම රැස්වීමේ දී නම් කළ හැක.

06 - 355

---

**විශේෂ ඇටෝර්නි බලය අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 06, පැරකුම්බා පෙදෙස, අංක 12 හි පිහිටි ලියාපදිංචි අංක P.V. 94728 දරන ද එනර්ජි මැනේජ්මන්ට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරුන් වන අප ද එනර්ජි මැනේජ්මන්ට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ආර්. එම්. ෆසීන් මහතා වර්ෂ 2017ක් වූ ජූනි 19 වැනි දින ලියා සහතික කරන ලද අංක 309 දරන බත්තරමුල්ල පිහිටි ප්‍රධාන කාර්යාලයේ ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර පොතේ 84 වන බාණ්ඩයේ 9249 වන පත්‍රිරුවේ 237 වන දිනපොත් අංකය යටතේ වර්ෂ 2018ක් වූ ජූනි මස 04 වැනි දින ලියාපදිංචි කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් කොළඹ 01, යෝක් වීදිය, අංක 124, කැෆේ රෙස්ටුරන්ට් හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක : 671781376V හිමි මොහොමඩ් කුදූස් මොහොමඩ් නසාර් යන අය වෙත පවරන ලද ඇටර්නි බලය මෙම දැන්වීමේ දින සිට බල පැවැත්වෙන පරිදි මින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලංකාවාසී සියලු දෙනා හට මින් දැනුම් දෙමි.

ද එනර්ජි මැනේජ්මන්ට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්.

06 - 368

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වැනි වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ

2007 අංක 7 දරන ආඥපනතේ වගන්ති අංක 9(2) වගන්තිය යටතේ "සර්වසාර ඇග්‍රෝ රිසර්ච් ඇන්ඩ් ටෙක්නොලොජි සෙන්ටර් ලිමිටඩ්" නැමැති සමාගම පහත දැක්වෙන පරිදි නාමය වෙනස් කර 2022.06.02 දින ලියාපදිංචි කරන ලදි.

| | | |
|---|---|---|
| සමාගමේ පෙර නාමය | : | සර්වසාර ඇග්‍රෝ රිසර්ච් ඇන්ඩ් ටෙක්නොලොජි සෙන්ටර් ලිමිටඩ් |
| සමාගමේ අංකය | : | PB 00228496 |
| ලියාපදිංචි ලිපිනය | : | අංක 31, මුතුහේනවත්ත පාර, දික්හැතැප්ම, මීගොඩ. |
| සමාගමේ නව නාමය | : | සර්වෝදය සර්වසාර ඇග්‍රෝ රිසර්ච් ඇන්ඩ් ටෙක්නොලොජි සෙන්ටර් ලිමිටඩ් |

සෙන්ට්‍රල් කෝපරේට් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු,
අංක 116/10, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.

06 - 369

---

# රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත්

**හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය**

2023 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ
විදේශ මත්පැන් රේන්දය විකිණීම

2023 ජනවාරි 01 වැනි දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා විදේශ මත්පැන් සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකට අදාළ එවකට බලපවත්වන කොන්දේසි මාලාවට යටත්ව පහත උපලේඛනයේ සඳහන් විදේශ මත්පැන් තැබෑරුම පවත්වාගෙන යාම සඳහා සුදුසු ගැනුම්කරුවකු තෝරාගැනීම පිණිස ටෙන්ඩර් භාර ගැනීම හොරණ ප්‍රාදේශීය ලේකම් වන මා විසින් **2022.08.15** දින **පෙ. ව. 10.30** දක්වා සිදුකරනු ලැබේ.

01. අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම-

02. *(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල වෙනුවෙන් රු. 3000/- ක් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමඟ සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍ර මගින් දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට අමුණා තැබිය යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමින් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරමවල නියමිත පරිදි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා ඔවුන්ගේ ලිපිනයන්ද සඳහන් කර තිබිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කර තිබිය යුතු ය.

(ඇ) මෙම නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතු අතර නියෝජිතයෙකු විසින් හෝ ලාංකික නොවූ හෝ 1982.08.20 වැනි දින අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද විදේශීය මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ, නුසුදුසු අයගෙන් ටෙන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ.

04. විධිමත්ව සකස් කරන ලද ටෙන්ඩර්පත්‍ර කවරයක බහා, සීල් තබා කවරයේ වම් කෙලවරේ "අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම් ටෙන්ඩරය 2023" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. එසේ සකස් කළ ටෙන්ඩර්පත්‍ර සහිත කවර,

(අ) හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ,

(ආ) ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම් **2022.08.15 වැනි දින පෙ. ව. 10.30** වේලාවට පෙර කාර්යාලයට ලැබෙන සේ "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හොරණ" යන ලිපිනයට එවිය යුතු ය. ඉහත සඳහන් වේලාවන් පසුව තැපෑලේදී ප්‍රමාද වී කාර්යාලයට ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩරය විකුණන දින නියමිත වේලාවට සියළුම ටෙන්ඩර්කරුවන් හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතු ය. මෙහි තුන්වන ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසිය යටතේ නුසුදුස්සෙකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් ඊට අවශ්‍ය ලියකියවිලි ද රැගෙන ආ යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින්, ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බැව් දැන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසි වලට අත්සන් තබා හොරණ ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරන මුදලක් ගෙවිය යුතු ය.

06. 2023 වර්ෂයට දැනට තැබෑරුම පිහිටුවා ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. අලුත් ස්ථානයක තැබෑරුම විවෘත කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් හොරණ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

07. වැඩි විස්තර හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් දැනගත හැකිය.

මෙම දැන්වීම අනුව **2022.08.15** දිනදී මෙම රේන්දය විකිණීමට නොහැකි වුවහොත් පමණක් **2022.09.15 දින පෙරවරු 10.30** දක්වා විකිණීම පිණිස ටෙන්ඩර්පත්‍ර භාරගනු ලබන බව ද, එසේම නැවත විකිණීම ද **2022.09.15 දින පෙ. ව. 10.30**ට සිදු කරන බවද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඩී. එස්. සජීවනා,
ප්‍රාදේශීය ලේකම්.

2022ක් වූ ජුනි මස 1 වැනි දින,
හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ග්‍රාමය | තැබෑරුම් විවෘත කර තබන වේලාව | තැබෑරුම් රේන්දය විකිණීමට ටෙන්ඩරය භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | 2022.08.15 දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීමේ දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|
| 01. | හොරණ | හොරණ නගර සභා සීමාව | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2022.08.15 දින පෙ. ව. 10.30 | 3,000 | 2022.09.15 දින පෙ. ව. 10.30 |

06 - 352

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**HNB 25 - 19**

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - යක්කලමුල්ල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දවූ ද 2018.05.25 වැනි දින දරන උකස් සාධන පත්‍රය මත අය විය යුතු මුදල් ගෙවීම හේවා වඩුගේ සරත් කුමාර, හේවා වඩුගේ ගිහාන් සමීර සහ කොටුවේ ජයනෙත්ති මුහන්දිරම්ගේ තේජා තිලක්ෂි යන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත උපලේඛනයේ සඳහන් දේපළ **වර්ෂ 2022ක් වූ ජූලි මස 20 වැනි දින පෙ. ව. 11.30 ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ මහ නගර සභා සීමාව ඇතුළත ඇත්තිලිගොඩ ග්‍රාම නිලධාරි වසම තුළ ඇත්තිලිගොඩ ගමේ පිහිටි ඉඩමට සර්වේයර් ජනරාල්වරයා විසින් සාදන ලද අංක 810017 දරන කැඩැස්තර සිතියමේ දැක්වෙන අංක 0095 දරන බෙදා වෙන් කරන ලද හෙක්ටයාර් බින්දුවයි දශම එකයි තුනයි තුනයි දෙක (0.1332) ක විශාලත්වයෙන් යුත් ඉඩම වේ. මෙය 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ අංක 00120004759 - මාතර දරන හිමිකම් සහතිකය යටතේ ලියාපදිංචි කර ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.06.14 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2019.06.25 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - ගාල්ල බස් නැවතුම් පලේ සිට මාතර මාර්ගයේ කි. මී. 2.4 ක පමණ දුරක් ගාල්ල සම්බෝධිය හන්දිය දක්වා පැමිණ වමට හැරී උඩුගම පාරේ කි. මී. 1.1ක් පමණ දික් ඇල හන්දිය දක්වා පැමිණ එතැනින් වමට හැරී කනම්පිටිය පාරේ මීටර් 25ක් පමණ ගිය පසු අදාළ දේපළට ළඟා විය හැක. එම දේපළ පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011 - 2661828, 2661866.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා,
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත,
පටුවත, දෙඩන්දූව.
දුරකථන අංක : 071 3358434, 0779-663420
Email : ejayawardhana77@gmail.com

06-299

---

HNB 40- 19

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.- මිද්දෙනිය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දවූ ද අංක 152 හා 2016.10.04 දින දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම පුෂ්ප කුමාර ආරියසිංහ ණය කරු ලෙස පැහැර හැර ඇති හෙයින්, අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ

**වර්ෂ 2022ක් වූ ජූලි මස 18 වැනි දින ප. ව. 12.30 ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

*දේපළ.-* සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න කෝරළේ දියපොත ගම් පත්තුවේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහ නගර සභා සීමාව තුළ, යෝදගම ග්‍රාම නිලධාරි වසම තුළ උඩගම ගමේ පිහිටි මෝදරවාන හෙවත් මෝදරවාන හේන්යාය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්නන් විසින් සාදන ලද අංක 4077/12 හා 2012.10.03 දින දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දක්වෙන බෙද වෙන් කරන ලද අක්කර තුනයි රූඩ් එකයි පර්චස් විසි එකක් (අ. 3, රූ. 1, පර්. 21) විශාලත්වයෙන් වූ ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ඇතුළු සෑම සියළු දේත් වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.07.26 දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2019.08.13 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - ඇඹිලිපිටිය ඔරලෝසු කණුව හන්දියේ සිට මිද්දෙනිය මාර්ගයේ මීටර් 800ක් පමණ වටරවුම හන්දිය දක්වා ගමන් කොට දකුණට හැරී රෝහල පාර දිගේ මීටර් 300ක් පමණ ගමන් කොට එතැනින් දකුණට හැරී නව නගරය පාරේ මීටර් 300ක් පමණ ගමන් කොට අවසානයේ වමට හැරී වාහන ගමන් කරන පාරේ මීටර් 100ක් පමණ ගමන් කරන්න. අදල දේපළ එම පාරේ දකුණු පස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011 - 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා,
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත,
පටුවත, දෙඩන්දූව.
දුරකතන අංක : 071 3358434, 0779-663420
Email : ejayawardhana77@gmail.com

06-300

**මහජන බැංකුව - මැජෙස්ටික් සිටි ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29ඩී වගන්තිය යටතේ වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමාව ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බම්බලපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත හැව්ලොක් ටවුන්හි බම්බලපිටිය මාර්ගය ඔස්සේ ද ෆොන්සේකා පෙදෙසේ පිහිටා ඇත්තාවූ ද, ගාලු පාර වරිපනම් අංක 237 සහ 237/1-1 දරන ඒ මත වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේද සමගින් බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්. කාවල්හෝ විසින් සාදන ලද 2014.10.14 වැනි දින අංක 184/2014 දරන පිඹුරේ ''ලොට් අංක 1A දරන ප්‍රමාණයෙන් පර්චස් පහළවයි දශම එකයි බින්දුවක් (ප.ර්15.10) හෙවත් හෙක්ටයාර් 0.0382ක් වූ ද ඉඩම් කොටස සහ එහි පස, ගහකොළ සහ ඒ මත වූ වෙනත් සියලු දේද වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 07, බුලර්ස් පටුමග, අංක 22 දරන ස්ථානයේ පදිංචි (ආරියපාල ට්‍රේඩ් සුපර් මාකට් යන ආයතනයේ පරම අයිතිකරුවන) අප්පු හැන්නදි තොටහේවාගේ ක්‍රිෂාන්ත ආරියපාල යන අය ණයකරු වශයෙන් මහජන බැංකුවට උකස් කරන ලද ඉහත උපලේඛනවල සඳහන් දේපළ

**වර්ෂ 2022ක් වූ ජූලි මස 15 වැනි දින ප. ව. 12.30ට** ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉඩම් වෙත පිවිසීම.- බම්බලපිටිය ශුද්ධ වූ කන්‍යාරාමය ඉදිරිපිට ඇති හොටෙල් ඇට්ලාන්ටික්, අංක 237 දරන ස්ථානය.

ගෙවීමේ ක්‍රමය.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%)
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%)
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. නොතාරිස් ගාස්තුව රු. 2,000
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්
07. ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි
08. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුලදී මහජන බැංකුව හි ප්‍රධාන කාර්යාලයේ හෝ මැජෙස්ටික් සිටි ශාඛාවේ තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

කළමනාකරු,
මහජන බැංකුව,
අංක 11,
ආදිපාද වීදිය,
කොළඹ 01.

දුරකථන : 011-2344985
ෆැක්ස් : 011-2447299

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ,
සහ උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණ බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.
අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකථන 011-2445393/011-2396520
ෆැක්ස් 011-2445393
ඊමේල් *senaservice84@gmail.com*

06 - 327

---

**මහජන බැංකුව" (මැජෙස්ටික් සිටි ශාඛාව)**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ගල්කිස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත දුටුගැමුණු ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ එස්. ද එස්. ජයසිංහ මාවත, කොහුවල, නුගේගොඩ යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද, වරිපනම් අංක 137/ 3, 1/1, 137/A දරන සහ 2014 අගෝස්තු මස 6 වැනි දින ලියාපදිංචි කරන ලද අංක 520802 දරන කැඩැස්තර පිඹුර ප්‍රකාර 'ලොට් අංක 177'

දරන ප්‍රමාණය හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි දෙකයි දෙකයි නවයක් වූ (0.0229)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 04, ආර්. ඒ. ද මෙල් මාවත, අංක 22 දරන ස්ථානයේ පදිංචි (ආරියපාල ට්‍රේඩ් සුපර් මාකට් යන ආයතනයේ පරම අයිතිකරුවන) අප්පු හැන්නදි තොටහේවාගේ ක්‍රිෂාන්ත ආරියපාල යන අය ණයකරු වශයෙන් මහජන බැංකුවට උකස් කරන ලද ඉහත උපලේඛනවල සඳහන් දේපළ

**වර්ෂ 2022 ක්වූ ජූලි මස 15 වැනි දින ප. ව. 02.30 ට** ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩම් වෙත පිවිසීම :-*

කොළඹ සිට නුගේගොඩ දෙසට යන විට දකුණු පසට ඇති එස්. ද එස්. ජයසිංහ මාවතේ ඉදිරියට මීටර් 150ක් ගියවිට Saegis Campus අසලින් දකුණට ඇති පාරේ ගියවිට අංක. 137/3 දරන ස්ථානය

*ගෙවීමේ ක්‍රමය :*

විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැනුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) නොතාරිස් ගාස්තුව රු. 2000/-,
(05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500/-,
(06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
(07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි,
(08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළදී මහජන බැංකුව හි ප්‍රධාන කාර්යාලයේ හෝ මැජෙස්ටික් සිටි ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ,
සහ උසාවි කොමසාරිස්වරු - කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණ බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු

අංක. 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12.

දුරකථන : 011-2445393/ 011-2396520
ෆැක්ස් : 011-2445393
ඊමේල් : senaservice84@gmail.com

කළමණාකරු, මහජන බැංකුව,
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.
දුරකථන 011-2344985
ෆැක්ස් 011-2447299

06-328

---

**සණස සංවර්ධන බැංකුව පී. එල්. සී. - කරාපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ, ගාල්ල මහනගර හා සීමා ඇතුළත මඩවලමුල්ල ගමේ හි පිහිටි ''ජවනාරන්ගහඕවිට'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. ඩී. සී. ගුණසිංහ විසින් 1988.07.06 වැනි දින මැන පිළියෙල කරන ලද අංක 773 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2හි ලොට් 2A වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණය පර්චස් දහය (පර්.10)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ A714/235 යටතේ ලියාපදිංචි කර ඇත.

බැද්දේගම ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. ටී. එල්. නන්දන විසින් 2012.05.02 වැනි දින සහතික කරන ලද අංක 7902 දරන සණස සංවර්ධන බැංකුව පීඑල්සී නමට ලියන ලද්දා වූ ද උකස් බැඳුම්කරය යටතේ අයවියයුතු මුදල් ගෙවීම සුහඳ ආරච්චිලාගේ ලන්කන් ප්‍රියන්ත ජයසිංහ මහතා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්ද, සණස සංවර්ධන බැංකුව පීඑල්සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව, උපලේඛනයේ දැක්වෙන දේපළ

**වර්ෂ 2022ක් වූ ජූලි මස 14 වැනි දින ප. ව. 02.30ට** ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.-* ගාල්ල ප්‍රධාන බස් නැවතුම්පොලේ සිට වක්වැල්ල පාර ඔස්සේ වක්වැල්ල දෙසට කිලෝමීටර් 2.5ක් පමණ ගමන් කර ජල්ගහ හන්දිය දක්වා පැමිණ වක්වැල්ල දෙසට තවත් මීටර් 150ක් පමණ ගමන් කළ විට දකුණු අත පැත්තේ පිහිටි විෂයගත දේපළ වෙත ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

*ගෙවීම් කළ යුතු ආකාරය.-* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%)
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත සණස සංවර්ධන බැංකුව පී.එල්.සී හි තැන්පත් කළ යුතුයි.
03. පළාත් පාලන අය බදු සියයට එකයි (1%)
04. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3,500

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

අනිකුත් තොරතුරු සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න :-

කළමනාකරු,
සණස සංවර්ධන බැංකුව පී.එල්.සී.,
අංක 255, සනී සයිඩ් ගාර්ඩන්,
කරාපිටිය.
දුරකථන 091-2245252

එල්. බී. සේනානායක
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,
අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් 011-2445393

06-329

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි - මහජන බැංකුව - බම්බලපිටිය ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29ඩී වගන්තිය යටතේ වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**1 වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහනගර සභා සීමාව ඇතුලත දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 540A, දෙහිවල බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුලත, දෙහිවල බටහිර අංක 8 දරන කොට්ඨාසයේ, දෙහිවල පිහිටා ඇත්තාවූද, එබනේසර් පෙදෙස, වරිපනම් අංක 2 දරන ''අලුත්වත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩංවෙල විසින් සාදන ලද 2006.11.15 දින අංක 6405 දරන පිඹුරේ ''ලොට් A'' දරන ඉඩම් කොටස ප්‍රමාණය පර්චස් හතරයි දශම නවයයි හතර (පර්.4.94)ක හෙවත් හෙක්ටයාර් 0.0125ක විශාල ඉඩම සමග ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේද වේ. මෙම ඉඩම දෙල්කඳ - නුගේගොඩ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දෙහිවල 141/03, 04 යටතේ ලියාපදිංචි කර ඇත.

**2 වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහනගර සභා සීමාව ඇතුලත දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 540A, දෙහිවල බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුලත, ලියනගේ පාර, දෙහිවල යන ස්ථානයේ පිහිටා ඇත්තාවූද, වර්තමානයේ දී ලියනගේ පාර, වරිපනම් අංක 78/8, දරන පරිශ්‍රය වන්නාවූ ද, ''ග්‍රේසියා කුඹුර සහ ග්‍රේසියා ඕවිට'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩංවෙල විසින් සාදන ලද 2014.03.10 දින අංක 10163 දරන පිඹුරේ ලොට් 267C[1] දරන ඉඩම් කොටස ප්‍රමාණය පර්චස් දහ අටයි දශම බිංදුවයි හතක් (පර්.18.07)ක හෙවත් හෙක්ටයාර් 0.0457ක විශාල ඉඩම සමග ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ වගාවන් සහ වෙනත් සියලු දේද වේ.

පහත විස්තර වන පරිදි ඉහත කී අංක 11 දරන පිඹුරේ ලොට් 267L ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස හරහා යෑම ඊමේ මාර්ග පරවශ්‍යතා අයිතිය ද එයට ඇතුළත් වේ එනම්,

ඉහත කී ලියනගේ පාර, දෙහිවල වරිපනම් අංක 72 දරන පරිශ්‍රයේ කොටසක් වූ ද, ඉහත කී ලියනගේ පාර, දෙහිවල පිහිටා ඇත්තාවූ ද ''ග්‍රේසියා කුඹුර සහ ග්‍රේසියා ඕවිට'' යනුවෙන් හඳුන්වනු ලබන

ඉඩම සඳහා වූ අංක 11 දරන පිඹුරේ ලොට් 267L ලෙස ලකුණු කර නිරූපනය කර ඇත්තාවූ ද ඉහත කී අංක 11 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතරයි දශම පහයි දෙකක්වූ ද (රූ.1, පර්.4.52) ලොට් 267L දරන ඉහත කී බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

අංක 108/11E, ලැවෙන්ඩර් උද්‍යානය, වටරප්පල පාර, ගල්කිස්ස යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තාවූ ද PV7752 දරන අංකය යටතේ ලියාපදිංචි වී ඇති සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වූ ඩී. එම්. ජීවන් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් සහ අංක 2, 2/1, එබනේසර් පෙදෙස, දෙහිවල යන ස්ථානයේ පදිංචි ගනේෂන් කෞමදි විවාහයට පෙර කෝමදි කපුඅත් පිල්ලෙයි හෙවත් කෞමදි ගනේෂන් උකස්කරු වශයෙන් මහජන බැංකුවට උකස් කරන ලද ඉහත උපලේඛනවල සඳහන් දේපළ මහජන බැංකුව විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව,

**1 වන උපලේඛනය**

**ලොට් A වර්ෂ 2022ක් වූ ජූලි මස 22 වැනි දින පෙ.ව. 09.30ට ද,**

**2 වන උපලේඛනය**

**ලොට් 267C[1] වර්ෂ 2022 ක් වූ ජූලි මස 22 වැනි දින පෙ.ව. 10.30ට ද ඉහත ස්ථානවලදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

**ඉඩම් වෙත පිවිසීම :**

**1 වන උපලේඛනය**

දෙහිවල මංසන්ධියේ සිට ගාලු පාර ඔස්සේ වැල්ලවත්ත දෙසට කි. මී. 1.1ක් ගියවිට වම්පසට ඇති එබනේසර් පෙදෙස ඔස්සේ මීටර් 30ක් ගියවිට පාරේ දකුණු පසින් අදාල දේපළ පිහිටා ඇත.

**2 වන උපලේඛනය**

කොළඹ සිට දෙහිවල දෙසට, ගාලු පාර ඔස්සේ යනවිට (මංසන්ධියට පෙර) වම්පසට හමුවන ඉන්ධන පිරවුම්හල අසලින් ඇති මල්වත්ත පාරේ මීටර් 300ක් ගියවිට වම්පසට හමුවන ලියනගේ පාරේ මීටර් 60ක් ගියවිට වම්පසින් අදාල දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%)
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%)
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. නොතාරිස් ගාස්තුව රු. 3,500
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්
07. ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි
08. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුලදී මහජන බැංකුව හි ප්‍රධාන කාර්යාලයේ හෝ බම්බලපිටිය ශාඛාවේ තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ,
සහ උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණ බලයලත්
වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක. 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12.

දුරකථන : 011-2445393/ 011-2396520
ෆැක්ස් : 011-2445393
ඊමේල් : thrivankasenanayake@gmail.com

කළමණාකරු, මහජන බැංකුව,
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.
දුරකථන 011-2344985
ෆැක්ස් 011-2447299

06-330

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ **වර්ෂ 2022 ක්**

වූ **ජූලි මස 22 වැනි දින පෙරවරු 11.00** ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කනදරා කෝරලේ අංක 23F, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කුඩා කලත්තෑව ග්‍රාමයේ පිහිටි සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක 256 දරන අවසාන ගම් පිඹුරේ ලොට් 91 යනුවෙන් දැක්වෙන වැව ඉහල මූකලාන (ගොඩ) නමැති රජයේ ඉඩම (නැවත මැනීමෙන් පසුව බලයලත් මිනින්දෝරු බී. එස්. මුණසිංහ විසින් සම්පාදිත 2008.09.18 දිනැති අංක 101/2008 දරන පිඹුරේ ලොට් 1 යනුවෙන් දක්වේ) වන ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි ගහකොළ ඇතුළු සියලු දේද වේ.

විශාලත්වය අ. 01, රූ. 03, පර්. 30

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.12.08 දිනැති අංක 8550 දරන ප්‍රාථමික උකස්කරය 2016.05.12 දිනැති 8691 දරන ද්විතීයික උකස්කරය සහ 2017.04.28 දිනැති 8974 දරන තෘතියික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම මෛත්‍රි වඩුගේ සුසන්ත වජිර කුමාර යන අය බන්ධනදයි/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා - වර්ෂ 2019 මැයි මස 10 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය* සහ වර්ෂ 2019 මැයි මස 03 වැනි දිනැති දිවයින, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ඉහත කී දේපලට පිවිසෙන මාර්ගය .-* අනුරාධපුර කච්චේරිය හන්දියේ සිට (ඩී එස් වට රවුම) නුවර පාර ඔස්සේ (A13) කිලෝ මීටර 10.5 කවරක්කුලම හන්දිය දක්වා ගමන් කොට වමට හැරී මීටර් 500ක් පමණ ඉදිරියට ගිය විට (1/1 සහ 1/2 බෝක්කු අතර) විෂයගත දේපල හමුවෙයි. එය ගල්කුලම - මාතලේ හන්දිය මහා මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*

(1) ගැණුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද, (සියයට දෙක හමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුද (රු. 7,000)

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදළ තොරතුරු සඳහා කළමණාකරු - ණය අය කර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 4667229.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක 0812210595, 0718446374

06-334

---

## පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියයි

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ වර්ෂ **2022 ක්වූ ජූලි මස 25 වැනි දින පෙ. ව. 11.30** ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(බිම් ප්‍රමාණය අ. 03, රූ. 0, ප ර්. 17.76)

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පානමයිපත්තු ප්‍රාදේශීය සභා සීමාවේ, උල්ලායිහි පිහිටි ''උල්ලයිකාඩු'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සංසරන්දෙණිය විසින් මැන සාදන ලද වර්ෂ 2000.09.22 දිනැති අංක 1016 දරන පිඹුරේ (බලයලත් මිනින්දෝරු එච්. ජේ. ජේ. ඇස්තෝක්කුප්පිල්ලයි විසින් මැන සාදන ලද වර්ෂ 1966.11.27 දිනැති අංක 27 දරන පිඹුරේ නිරූපිත ඉඩමෙන් එහි දකුණු දිශාවේ පිහිටි ඉඩම් කොටස බෙදා වෙන් කිරීමකි) ''ලොට් 06'' දරන ඉඩම සහ ඒ මත පිහිටා ඇති සියලු දේත් සමග මාර්ග අයිතිවාසිකම් ද සමග වේ.

*දේපළට පිවිසෙන මාර්ගය.-* පොතුවිල් ඔරලෝසු කණුව අසලින් පානම පාරේ, කිලෝ මීටර් 5ක් පමණ ගමන් කළ පසු කිලෝ මීටර් 5 කණුවට සහ සමර් කොටේජ් හෝටලයට පෙර පාරේ දකුණු අත පැත්තේ දේපළ පිහිටා ඇත.

ආදම්බාවා අබ්දුල් කයියුම්, අබ්දුල් කයියුම් අබ්දුල් සුභාන් සහ අබ්දුල් කයියුම් අබ්දුල් අහීල් යන අය බන්ධනදයින්/උකස්කරුවන් ලෙස ද

ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කල්මුණේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. රකීබ් විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.05.23 දිනැති අංක 895 සහ වර්ෂ 2013.11.14 දිනැති අංක 1093 උකස් බැඳුම්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය* - සඳහා වර්ෂ 2022.04.25 වැනි දින දි අයිලන්ඩ්, දිවයින, තිනක්කුරල් පුවත්පත් සහ වර්ෂ 2021.05.21 වැනි දින ගැසට් පත ද බලන්න.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් 19 උපදෙස් සහ නීති රීති වලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
(4) ප්‍රචාරක වියදම් ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
(6) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු කළමණාකරු-ණය අයකරගැනීම් පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 -4667130, 011- 4667412/ 011- 4667237

පී. කේ. ඊ. සේනාපති,
බලයලත් වෙන්දේසිකරු.

අංක. 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 011 2873656, 0777 672082
ෆැක්ස් අංකය : 011 2871184.

06-337

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ **වර්ෂ 2022 ක් වූ ජූලි මස 15 වැනි දින පෙරවරු 10.00** ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ මැද පත්තුවෙහි අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොස්කඳවල අංක 308 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොස්කඳවල ග්‍රාමයෙහි පිහිටි, මාරගහවත්ත හෝ මාරගහවත්තේ කොටසක් හෙවත් මාරගහවත්ත කැබැල්ල නැමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු කේ. ඒ. අනුරුද්ධ පෙරේරා විසින් සම්පාදිත 2014/03/23 දිනැති අංක 839 දරන පිඹුරේ දැක්වෙන ලොට් 6A1 නැමැති (බලයලත් මිනින්දෝරු ඩී. පී. ඩී. ජේ. දිසානායක විසින් සම්පාදිත 1998/11/24 දිනැති අංක 1330 දරන පිඹුරේ දැක්වෙන ලොට් 6A හි පවත්නා මායිම්වල නැවත මැනීමක් වන) ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැවිලි සහ අනිකුත් සියලු දෙය වේ.
විශාලත්වය රූ. 02, පර්. 30.74

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එල්. එම්. ටී. විජේසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2018/05/18 දිනැති අංක 346 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2018.12.31 දිනැති අංක 476 දරන ද්විතීයක උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම වක් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම විසින් බන්ධනදායි/උකස්කරු" වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2022 මැයි මස 06 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයද, සහ වර්ෂ 2022 අප්‍රේල් මස 25 වැනි දිනැති දිවයින, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ඉහත කී දේපලට පිවිසෙන මාර්ගය .-* යක්කල නගරයේ සිට කිරිඳිවැල පාර දිගේ කිලෝමීටර 1.8ක් පමණ බටගොල්ල හන්දිය දක්වා පැමිණිය යුතුය. ඉන්පසු දකුණට ඇති පිලිකුත්තුව පාරට හැරී මීටර 300 පමණ "ජීවක නිෂ්පාදන ආයතනය" පසුවන තෙක් ඉදිරියට ගොස් වමට හැරී කොන්ක්‍රීට් අතුරන ලද වාහන ගමන් කළහැකි පාරේ මීටර 250ක් පමණ T මංසන්ධිය දක්වා පැමිණිය යුතුයි. ඉන්පසු වමට හැරී මීටර 50ක් පමණ ගොස් නැවත දකුණු පසින් ඇති වාහන ගමන් කළ හැකි මාර්ගයෙහි මීටර 100ක් පමණ ගිය විට එම පාරේ දකුණු පසින් විෂයගත දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද, (සියයට දෙක හමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුද (රු. 7,000)

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිළේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදළ තොරතුරු සඳහා කළමණාකරු - ණය අය කර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 4667229.

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3), විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011-3068185, 071-4177199

06-338

---

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව උඩුගොඩගේ ප්‍රේමලාල් රංජිත් සහ අරුණ ශිවන්ත උඩුගොඩ යන අය ණයගැණුම් කරුවන් වශයෙන් හා අරුණ ශිවන්ත උඩුගොඩ යන අය උකස්කරු වශයෙන් නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී එල් සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපළ

**2022 ක්වූ ජූලි මස 18 වැනි දින පෙ. ව. 11.00 ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**ඉතා වටිනා සියලු පහසුකම් සහිත පදිංචියට සුදුසු දේපලක්**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මැදකින්ද මහපළාත කෝරළයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹේගොඩ ග්‍රාම නිලධාරි වසමේ බණ්ඩාරවෙල කොට්ඨාසයේ මැටිපිඹිය ගමේ පිහිටි ''පරණගෙදරවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු විජිත සෙල්ලහේවා විසින් මැන සාදන ලද අංක 2233 සහ 2011.07.09 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 2 වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන් කළ බිම් කොටස සහ තුළ පිහිටි පර්චස් තිස්නවයකුත් දශම පහයි හතරක් (පර්. 39.54) විශාල ඉඩම් කැබැල්ල සහ එහි තුළ පිහිටි මහල් ගොඩනැගිල්ල ගහකොළ වගාව ඇතුළු සෑම සියළු දේ.

*දේපළට පිවිසීම.* - බණ්ඩාරවෙල නගර මධ්‍යයේ සිට වැලිමඩ පාරේ. කි. මී. 04 කණුව අඹේගොඩ හන්දිය දක්වා ගමන් ගෙන වම් පසට පිහිටි කොන්ක්‍රීට් එලන ලද, මැටිපිඹිය දෙසට පිහිටි පාරේ මීටර් 400ක් පමණ ගමන් ගත් පසු අදල දේපළ මෙම පාරේ දකුණු පසින් පාරට මායිම්ව පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2021.03.26 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද , 2021.03.22 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු.1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු මධ්‍යගත (අයකිරීම් අංශය) නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අංක 40 නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011- 2 448 448.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත්
බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

06-342

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක : 74475077, 74475170, 74475261

කන්තලේ, රජ ඇල, අංක 694/4 හි චම්පිකා රයිස් මිල්ස් හි අයිතිකරුවන් වන රන්තිලක ගෙදර වීරසිංහ මහතා සහ රන්තිලක ගෙදර කරුණාදාස මහතා සහ කෝදාගොඩ ගමගේ පද්මිණි මහත්මිය සහ රන්තිලක ගෙදර නිමල්කා මදුවන්ති රන්තිලක මහත්මිය යන අයගේ හවුල් ව්‍යාපාරය යටතේ ඇති 'චම්පිකා රයිස් මිල්ස්' සමාගමට අයත් උකස් කරන ලද දේපල විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 ජූලි 07 දිනැති අංක 2027 දරන *ගැසට් පත්‍රයේ* හා 2017 ජුනි 27 දින ''ඩේලිනිව්ස්'', ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර ලංකා බැංකුව කන්තලේ පරිශ්‍රයේදී

**2022 ජූලි 28 වැනි දින පෙ. ව. 11.00ට**, කොළඹ 08, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්ස්, අංක 06Aහි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**පළමු උපලේඛනය**

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 227/B දරන රජ ඇල ග්‍රාම සේවක නිලධාරි කොට්ඨාසයේ රජ ඇල ග්‍රාමයේ (කට්ටලෙයි පත්තුව) පිහිටි රජ ඇල කොලනි නැමති ඉඩමෙහි ලොට් 780හි නැගෙනහිර පස බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 780 උතුරට ලොට් 741 ද, නැගෙනහිරට ලොට් 780ද, දකුණට ලොට් 781 ද, බස්නාහිරට ලොට් 782 ද, මායිම්ව එහි ඇති නිවෙස සහ වී මෝල සහිතව අක්කර එකයි පර්චස් විසිතුනයි දශම බිංදුවයි හයක (අ.1, රූ.0, පර්. 23.06) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ත්‍රිකුණාමල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/P/3/54 සහ 55හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු කේ. සෙල්ලපිල්ලෙ විසින් මෑතකදී සාදන ලද 1997 සැප්තැම්බර් 19 දිනැති අංක 553 දරන මිනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 227/B දරන රජ ඇල ග්‍රාම සේවක නිලධාරි කොට්ඨාසයේ කන්තලේ රජ ඇල කොට්ඨාස අංක 4හි පිහිටි රජ ඇල, රජ ඇල කොලනි ඒකක 4/694 නැමති ඉඩමෙහි අංක 553 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට පාරද, නැගෙනහිරට පාරද, දකුණට එකී අංක 553 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 2ද, බස්නාහිරට F.T.P.2හි ලොට් 782 ද මායිම්ව එහි ඇති නිවෙස සහ වී මෝලකින් සමන්විත වන අතර එකී අංක 553 දරන පිඹුරට අනුව අක්කර එකයි පර්චස් විසි තුනයි දශම බිංදුවයි හයක (අක්කර 1, රූ.0, පර්.23.06) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

**දෙවන උපලේඛනය**

ඉහත දෙවන උපලේඛනයේ විස්තර කළ ඉඩමට හා පරිශ්‍රයට සවිකර ඇති සියලු යන්ත්‍රාසාර සහ යන්ත්‍රෝපකරණවලට පහත සඳහන් දෑ අයත් වේ.

Description of Machinery (යන්ත්‍රෝපකරණ වල විස්තරය)

1. Two 18 feet Elevators with 2 H. P motors
2. Paddy cleaner with 3 H. P motor
3. Two paddy stoners within 2 H. P motor
4. Two Hullers with 10 H. P motord
5. Two 12 feet elevators with 2 H. P motors
6. Automatic elevator and Huller with 10 H.P. motors
7. Separator with 15 H. P Motors
8. Polisher with motor
9. Two Rice Stoner with 2 H. P Motors
10. 17 feet Elevator with 2 H. P Motors
11. Winnower with 2 H. P Motors
12. Winnower with 2 H. P Motors
13. Paddy drier with 30 H. P Motors
14. Paddy cleaner with 3 H. P. Motors
15. Huller with 25 H. P. Motors
16. Two 12 feet elevators with 2 H. P Motor
17. Two Winnower fans with 2 H. P. Motors
18. Polisher with 25 HP motor and starter
19. Rice Stoner with 3 HP motor and starter
20. 18 feet Elevator with 2 HP motor and starter

21. 12x4x4 feet Rice Bin
22. Grader with motor starter
23. 110KVA Generator
24. Boiler
25. Blower
26. Suction Fan

සහ සෑම ආකාරයකම මෙන්ම දැනට කුමන ආකාරයකට හෝ විස්තර කර ඇති සහ මින් පසුවට මෙම පළමු උපලේඛනයේ විස්තර කර ඇති පරිශ්‍රයට සවි කිරීමට නියමිත වෙනත් සියලු දේද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. විජයබාස්කර්,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
කන්තලේ ශාඛාව.

06-344

---

## සෙලාන් බැංකුව පීඑල්සී - දඹුල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ කුලතුංග මුදියන්සේලාගේ එඩ්මන් සිල්වා හෙවත් කුලතුංග මුදියන්සේලාගේ එක්මන් සිල්වා යන අය බන්ධනදායී/ උකස්කරු වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.
1. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර, පල්ලේසියපත්තුව, වගපහන, දඹුල්ල මහනගර සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසය තුළ දඹුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ හලුඅපුල්ලන වැව ගමේ පිහිටි කජුයාය නැමැති ඉඩමේ කොටසකට බලයලත් මිනින්දෝරු පී. වී. බී. ධර්මරත්න විසින් සාදන ලද 2016.06.30 දිනැති අංක 3198 සී දරන සැලැස්මේ නිරූපනය වන ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 3198 සී සැලැස්ම අනුව පර්චස් විසිපහයි දශම තුනක් (පර්. 25.3) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

2. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර පල්ලේසිය පත්තුව, වගපනහ, දඹුල්ල මහ නගර සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසය තුළ දඹුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ හලුඅපුල්ලන වැව ගමේ පිහිටි කජුයාය නැමැති ඉඩමේ කොටසකට බලයලත් මිනින්දෝරු පී. වී. බී. ධර්මරත්න විසින් සාදන ලද 2016.06.30 දිනැති අංක 3198 සී දරන සැලැස්මේ නිරූපනය වන ලොට් 3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 3198 සී සැලැස්ම අනුව පර්චස් විසිතුනයි දශම තුනක් (අ. 0: රූ. 0: පර්. 23.3) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ **2022 ජූලි** මස **21** වැනි දින පෙරවරු **10.30** ට සෙලාන් බැංකුව පීඑල්සී දඹුල්ල ශාඛාව පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* :- දඹුල්ල සෙලාන් බැංකුව අසල සිට කුරුණෑගල මාර්ගය ඔස්සේ කි. මී. 1ක පමණ දුරක් ගොස් (උසාවියට මීටර් 50කට නුදුරින්) වළගම්බා පිරිවෙන මංසන්ධිය දක්වා පැමිණ කොන්ක්‍රීට් කර ඇති පිරිවෙන මාර්ගයට හැර තවත් මීටර් 80 ක පමණ දුරක් ගියවිට අදාල දේපල මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කොවිඩ් 19 උපදෙස් සහ නීති රීතිවලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම* :- රජයේ ගැසට් පත්‍රයේ 2021.04.16 වැනි දින පළවී ඇති අතර අද, ඩේලිමිරර් සහ ටැමිල් මිරර් යන පුවත්පත්වල 2021.04.22 වැනි දින පළවී ඇත.

*ගෙවීම් ක්‍රමය* :- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(01) ගැනුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද, (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකයි දශම පහයි), (04) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500, (06) සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැනුම් මිලෙන් 90%ක් වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.
ඉහත් සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.
දු. අ. : 011-2456473, 2456478

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.
අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකථන : 0113068185, 0112572940

තුසිත් කරුණාරත්න,
සාම විනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

06 - 354

**මහජන බැංකුව - බත්තරමුල්ල ශාඛාව**

**වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

1986 අංක 32 දරණ පනතින් සංශෝධිත 1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ විකිණුම් දැන්වීම.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 40 බී විජය රජදහන සහ 40 සී තිළිණගමග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අම්බන ගමෙහි පිහිටියා වූ ද, සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද අංක 510216 දරණ කැඩැස්තර සිතියමේ (Cadastral Map) කලාප 01 හි පත්‍ර අංක 01 කැබලි අංක 0002 වශයෙන් දක්වෙන පිඹුර ප්‍රකාරව හෙක්ටයාර් බින්දුවයි තුනයි හයයි එකක (හෙක්. 0.0361) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් හා එහි පිහිටි සියලුම දේත් සමග වේ. මෙය මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම් පත් ඉරු අංක 2516235 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුව විසින් මා වෙත පවරණ ලද බලය යටතේ මා විසින් **2022 ජූලි මස 22 වන දින ප.ව. 12.30** ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම* :- කොළඹ නුවර පාරේ පස්යාල හන්දිය දක්වා ගමන් කර එතැනින් මීරිගම පාර ඔස්සේ ගමන් කල විට වමට ඇති විජය රජදහන පාරේ (මහේන්ද්‍ර විජේරත්න මාවත) මීටර් 150 ක් පමණ ගමන් කල විට දුම්රිය මාර්ගය පසුකල හමුවන වයි හන්දියෙන් දකුණට ඇති තිළිණගම පාරේ මීටර් 600ක් පමණ ඉදිරියට ගිය විට (ජල ටැංකිය පසුකරනවාත් සමගම) දකුණට ඇති පාර අවසානයේ අංක 71/1 දරණ ස්ථානයේ මෙම දේපල පිහිටා ඇත.

වැඩි විස්තර සඳහා 2019-11-15 දිනැති ''දිනමිණ'' සහ ''ඩේලිනිව්ස්'' පුවත්පත්වල පළවූ වෙන්දේසි යෝජනාව සහ 2019-11-15 වැනි දින රජයේ ගැසට් පත්‍රයට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය* : සාර්ථක ගැනුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. :

(01) ගැනුම් මිලෙන් 10% ක්.
(02) පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක් වන පළාත් අධිකාරි බද්ද.
(03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්.
(04) ලිපිකරුගේ හා සෝෂක ගාස්තු වශයෙන් රුඃ 4000 ක් ද,
(05) විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
(06) විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත දී නුගේගොඩ, හයිලෙවල් පාරේ, අංක 177 ඒ හි පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරු වෙත (කොළඹ පිටත) ගෙවිය යුතුය. දුරකථන අංක : 2768018, 2812260, 4305863 ෆැක්ස් අංක : 2817737, 2813969

හිමිකම් ඔප්පු සහ වෙනත් අදළ විස්තර ඉහත ලිපියෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු.) වෙන්දේසිකරු හා
තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිවුරුම් ලත් භාෂා පරිවර්ථක.

''කිංස්වීව්'' නිවස
282/3, 5/2, කෝට්ටේ පාර, නුගේගොඩ.
දු.ක. 071-8021206

06- 353/1

---

**මහජන බැංකුව - නුගේගොඩ ශාඛාව**

**වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

1986 අංක 32 දරණ පනතින් සංශෝධිත 1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකිණුම් දැන්වීම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ ගල්කිස්ස ගම්සභා සීමාව තුළ පමුණුව යන ගම පමුණුව පාරේ වරිපනම් අංක 96/1 (කොටසක්) දරණ තැන පිහිටි '' ඔබවත්ත හෙවත් මිල්ලගහවත්ත'' නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන මහතා විසින් 1984.03.21 දින මැන සාදන ලද අංක 1434 දරණ පිඹුර ප්‍රකාර බෙදා වෙන්කරන ලද ලොට් අංක 3ඊ2 දරණ පර්චස් දහසයයි දශම හයයි බිංදුවක් (අ.0 රූ.0 පර්.16.60) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද වේ.

ඉහත කී පමුණුව යන ගම පමුණුව පාරේ පිහිටි '' ඔබවත්ත හෙවත් මිල්ලගහවත්ත'' නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන මහතා විසින් 1984.03.12 දින මැන සාදන ලද අංක 1432 දරණ පිඹුර ප්‍රකාර බෙදා වෙන්කරන ලද ලොට් අංක 3 සී දරණ පර්චස් දහතුනයි දශම හයයි බිංදුවක් (අ.0 රූ.0 පර්.13.06) ක් විශාල බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් පරිහරණය කිරීමේ අයිතිවාසිකම් ද වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2369/293 හා එම් 3014/193 දරණ පත්ඉරු යටතේ ලියාපදිංචි වී ඇත.

මහජන බැංකුව විසින් මා වෙත පවරණ ලද බලය යටතේ මා විසින් **2022 ජූලි මස 21 වන දින පෙ.ව. 10.30** ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යංශය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකුලව පවත්වනු ලැබේ.

දේපලට පිවිසිම :- මහරගම සිට පරණ පාර හරහා පමුණුව පාරේ කි.මී. 1.0 ක් පමණ ගිය විට දකුණු පැත්තේ ඇති අඩි 10 ක් පලළ මිල්ලගහවත්ත පෙදෙස පාරේ මී.100 ක් පමණ ගියවිට එම පාරේ අවසානයේ මෙම දේපල පිටා ඇත.

වැඩි විස්තර සඳහා 2009-10-15 දිනැති ''දිනමිණ'' සහ ''ඩේලිනිව්ස්'' පුවත්පත්වල පළවූ වෙන්දේසි යෝජනාව සහ 2009-08-21 දින හා 2010.05.21 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළකළ වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

ගෙවීමේ ක්‍රමය : සාර්ථක ගැනුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. :

(01) ගැනුම් මිලෙන් 10% ක්.
(02) පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක් වන පළාත් අධිකාරි බද්ද.
(03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්.
(04) ලිපිකරු හා සෝෂක ගාස්තු වශයෙන් රු: 4000 ක් ද,
(05) විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
(06) විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත දී නුගේගොඩ, හයිලෙවල් පාරේ, අංක 177 ඒ හි පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරු වෙත (කොළඹ පිටත) ගෙවිය යුතුය. දුරකථන අංක : 2768018, 2812260, 4305863 ෆැක්ස් අංක : 2817737, 2813969

හිමිකම් ඔප්පු සහ වෙනත් අදළ විස්තර ඉහත ලිපියෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ, අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු.) වෙන්දේසිකරු හා
තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිවුරුම් ලත් භාෂා පරිවර්ථක.

''කිංස්වීව්'' නිවස
282/3, 5/2, කෝට්ටේ පාර, නුගේගොඩ.
දු.ක. 071-8021206

06- 353/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

අයි.එස්.අත්තනායක සහ එච්.ඩබ්ලිව්.එම්.එන්.කේ.විජේසිංහ.
ගිණුම් අංක : 0008 5003 8562

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2017.11.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැත්තෑ හතර ලක්ෂ හැත්තෑ නම දහස් හත්සිය විස්සයි ශත හැත්තෑවක (රු. 7,479,720/70) මුදල ද, 2017 නොවැම්බර් 07 දින සිට අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට නම ලක්ෂ දහසය දහස් හත්සිය හැට අටයි ශත අනූවක (රු. 6,916,768/90) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2018.01.26 දින රජයේ ගැසට් පත්‍රයේ 2018.01.17 දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි

**2022.07.26 දින ප. ව. 01.30** ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්යේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ මහර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ එඬේරමුල්ල නැගෙනහිර අංක 255**E** දරණ ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ එඬේරමුල්ල පිහිටි ''දෙල්ගහවත්ත'' යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. එස්. කේ. හේරත් යන අය විසින් සාදන ලද 2015 දෙසැම්බර් 13 දාතම හා අංක 2810 දරණ පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ආර්.ඒ.එන්.එල්.පෙරේරා යන අයගේ ඉඩම නැගෙනහිරට :ආර්.ඒ.එන්.එල්.පෙරේරා යන අයගේ ඉඩම සහ ලොට් 3 දකුණට : ලොට් 2 සහ බස්නාහිරට :කේ.එස්. සිල්වා සහ කරුණාවතී යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම හතයි හයක් (**A.** 0: **R.** 0: **P.** 5.76) විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමඟ එකී අංක. 2810 දරණ පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව **M** 377/89 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් ද දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය :-

අංක 2810 දරණ එකී පිඹුරේ නිරූපිත ලොට් 3 (මාර්ගය සඳහා වෙන් කිරීම)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්

06-357